#mediaethicsSL #SinhalaPress #Ika #SathiAgaAruna
තමන්ගේ ප්‍රවෘත්තියක නිරවද්‍යතාවය ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් හැකි සෑම සියළු සාධාරණ ප්‍රයත්නයක්ම දැරීමත්, පාඨකයාව සිතා මතාම නොමග යවන සුළු ආකාරයේ වාර්තාකරණයන්ගෙන් වැළකීමත්, ඉතා වැදගත් ජනමාධ්‍ය ආචාර ධර්මයන් බව අපි දනිමු. කෙසේ වුවත් ඇතැම් පුවත් දකිනා විට, ඇතැම් ජනමාධ්‍යවේදීන් උක්ත කියූ ආචාර ධර්මයන් කෙතරම් බැරෑරුම්ව ගන්නේදැයි පැනයක් මතුවේ.

උදාහරණයක් ලෙසින් අරුණ පුවත්පතේ සඳහන් වූ මෙම ප්‍රවෘත්තිය ගත හැක. මෙහි සිරස්තලයේ සඳහන් වන්නේ 'හදිසි නීතිය ඉවතට, තවුහිද් ජමාත් තහනම අහෝසියි' යනුවෙනි. උපසිරස්තලයේ 'රඳවා සිටින ත්‍රස්තයින් 200 කට නිදහස' යනුවෙන්ද සඳහන් වේ. කෙසේ වෙතත් ප්‍රවෘත්තියේ අන්තර්ගතයේ සඳහන් වන්නේ හදිසි නීතිය ඉවත් කිරීම නිසා මැයි 13 දින අති විශේෂ ගැසට් පත්‍රයක් මගින් තහනම් කළ ජාතික තවුහිද් ජමාත්, ජමාතේ මිල්ලතේ ඊබ්‍රාහිම්, වියලාන් අස් සෙයිලාන් සංවිධාන වල තහනමට බලපෑමක් එල්ල විය හැකි බවයි. එසේම හදිසි නීතිය ඉවත් කිරීම නිසා දැනට රඳවා තබාගෙන ප්‍රශ්න කරන සැකකරුවන් සම්බන්ධයෙන් නීතිමය ගැටළු මතුවිය හැකි බව ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යවරයාගෙන් මේ සම්බන්ධයෙන් අරුණ විමසූ අවස්ථාවේ පැවසුණු බවද වැඩිදුරටත් සඳහන් විණි.

කෙසේ නමුත් මෙම ප්‍රවෘත්තියේ සහ එය ඉදිරිපත් කිරීමේ ගැටළු ගණනාවක්ම ඇත. පළමුව, හදිසි නීතිය ඉවත් කිරීම නිසා ඉහත සඳහන් සංවිධාන වල තහනමට බලපෑමක් එල්ල නොවේ. මන්ද එම සංවිධාන තහනම් කිරීම සිදුවූයේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේද වන බැවිනි. ඒ නයින් මෙම පුවතේ සිරස්තලය සාවද්‍ය වේ. එසේම ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යවරයා පවසා ඇත්තේ සැකකරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී නීතිමය ගැටළු මතුවිය හැකි බව පමණි. නමුත් අරුණ පුවත්පත මගින් එය ස්ථිරව සිදුවන්නක් ලෙසින් ගෙන, 'රඳවා සිටින ත්‍රස්තයින් 200 කට නිදහස' ලෙසින් සාවද්‍ය සිරස්තලයක් ඉදිරිපත් කොට ඇත. පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා විසින් විශේෂ ප්‍රකාශයක් නිකුත් කරමින්, හදිසි නීතිය ඉවත් කිරීම ඔස්සේ පාස්කු ඉරිදා ප්‍රහාර විමර්ශණයන්ට බාධා සිදු නොවන බවත්, ඒ සම්බන්ධයෙන් අනවබෝධයෙන් යුත් පිරිසක් විසින් අසත්‍ය ප්‍රචාර සිදුකරන බවත් සඳහන් කර ඇත. මීට අමතරව අරුණ පුවත්පත සඳහන් කොට ඇත්තේ 'තවුහිද් ජමාත් තහනම අහෝසියි' යනුවෙනි. නමුත් සැබවින්ම තහනමට ලක්ව ඇත්තේ ජාතික තවුහිද් ජමාත් සංවිධානය පමණි. තහනමකට ලක් නොවූ වෙනත් තවුහිද් ජමාත් සංවිධානද පවතින බව මෙහිදී සඳහන් කළ යුතුවේ.

මෙසේ නිරවද්‍යභාවය බරපතල ලෙසින් ප්‍රශ්නකාරී වන, පාඨකයා නොමග යවන සුළු ආකාරයට වන සිරස්තල හා අන්තර්ගතයන් සහිත පුවතක් ප්‍රකාශ කිරීමෙන් අරුණ පුවත්පත මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය කොට ඇත. එම පුවතේ කරුණු පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයාගේ ප්‍රකාශය මගින්ද සාවද්‍ය වන බවට ස්ථිර වීමත් සමගින්, අරුණ පුවත්පත ඒ සම්බන්ධයෙන් නිවැරදි කිරීමක් පළ කරන්නට උත්සුක නොවන්නේ මන්ද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?